## Abstract No 91

# චමත්කාරය පිළිබඳ බටහිර සාහිත්‍ය සංකල්පය නිරාවරණයෙහි ලා භාරතීය රස සංකල්පයෙහි ප්‍රවේශය පිළිබඳ විමර්ශනයක්.

**අලවල පඤ්ඤානන්ද හිමි**
ශ්‍රී නාගරුක්ඛාරාමය, මීගහවත්ත, දෙල්ගොඩ
pannananda2014@gmail.com

අපරදිග සාහිත්‍යය සංවාදයෙහි සංකීර්ණ සංකල්පයක් ලෙස සාකච්ඡාවට ගැනුණු චමත්කාරය (sublime) නම් සංකල්පය නිරාවරණය කර ගැනීමට භාරතීය රස සංකල්පයෙන් දෘෂ්ටිමය ආලෝකයක් සැපයේ. මේ පිළිබඳ ව මෙරට කරන ලද පර්යේෂණ චමත්කාරය හා රසවාදයෙහි මතුපිට සාම්‍ය පිළිබඳ ව සාකච්ඡා තුළට සීමා වූ අතර එකක ආලෝකයෙන් අනෙක විනිවිද යෑමෙහි දෘෂ්ටිමය සංස්පර්ශයක් වෙතට යොමු වූයේ නැත. චමත්කාරය යන්නෙන් ලොව පියකරු බව හා බියකරු බව තුළින් උපදින ආශ්චර්යජනක, විස්මයෝත්පාදිත මානසික තත්ත්වය යැයි බටහිර වියතුන්ගේ හඳුනා ගැනීමට ලක්විණ. සුන්දරත්වය යන සීමාව චමත්කාරයෙහි දී අතික්‍රමණය කෙරෙන බැව් පොදු මතය විය. මෙහි දී වඩාත් නිශ්චිත වූ අර්ථකථන දැක්වීම් වෙනුවට ඒ පිළිබඳ ව නිරාවරණය කර ගැනීමට විවිධ දාර්ශනික ආස්ථානයන්හි සිට ගනු ලබන ප්‍රවේශයන් අපරදිග චමත්කාරය පිළිබඳ සංවාදයන්හි හමු වේ. සුන්දරත්වයත් චමත්කාරයත් අතර පරස්පරතාව හඳුනා ගැනීමෙන් චමත්කාරයෙහි ස්වභාවය නිරාකරණයට එඩ්මන් බර්ක්, චමත්කාර ජනනයෙහිලා ලොව ගූඪත්වය සහ අපරිමිතත්වය පිළිබඳ ස්වභාවයන්හි බලපෑමත් එහිලා මානව බුද්ධියෙහි උපරිම සීමාතික්‍රමණයත් මගින් චමත්කාරය හඳුනාගන්නට ඉමැනුවෙල් කාන්ට්, පශ්චාත්වාදී දෘෂ්ටියකින් සම්මත සමාජ තත්ත්වයන් ආකෘතීන් බිඳ දමා නව භාවමය ක්ෂේත්‍රයක් වෙතට කැඳවන ප්‍රපංචයක් ලෙස ජේ. එෆ්. ලියොටාත්, ඇපොරියා සංකල්පය මගින් ද්විමානීය බවෙහි ඇති වන මනෝභාව ක්‍රියාකාරීත්වයේ ඵලයක් ලෙස ජැක් ඩෙරීඩාත් චමත්කාරය අනාවරණය කරන්නට විවිධ දාර්ශනික පිවිසුම් ගත්හ. සංකීර්ණ විග්‍රහයන්ට ලක් වූ චමත්කාර සංකල්පය අනාවරණයට සූක්ෂ්ම වූත් පැහැදිලි වූත් ශාස්ත්‍රීය ප්‍රවේශයක් භාරතීය රස සංකල්පයෙන් හෙළි වේ. බාහිර ලෝකයෙන් ලැබෙන ආරම්මණ හා මනස අතර අන්තර් ක්‍රියාවලියක ප්‍රතිඵල ලෙස ප්‍රකම්පිත ස්ථාවර මිනිස් භාවයන්ගෙන් ඇරඹී දියුණු ආහ්ලාදනීය තත්ත්වයන්ට එම භාවයන් පරිවර්තනය වීමත් එමගින් උත්පාදිත තත්ත්වයන්ගේ පරමානන්දනීය හෙවත් සාරවත් ම ප්‍රදේශයක් ලෙස චමත්කාරය පිළිබඳ ව හෙළි කෙරෙයි. භරත රස සූත්‍රය පදනම් ව කළ මෙම පර්යේෂණයෙහි දී විශ්ලේෂණමය සහ අන්තර් සම්බන්ධිත අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස චමත්කාර ජනන ක්‍රියාවලියෙහි ඇති සූක්ෂ්ම සහ නිශ්චිත විග්‍රහය භාරතීය රස සංකල්පය බව අපගේ නිගමනය යි. එමගින් මෙම සංකල්පය නිරාවරණයට ගත හැකි ප්‍රවේශය ශාස්ත්‍රීය හා සාහිත්‍ය විචාරමය න්‍යායක් ලෙස සාහිත්‍යමය සංවාදයෙහි චමත්කාරය පිළිබඳ ව නිරාවරණයට සැපයෙන වැදගත් ශාස්ත්‍රීය ප්‍රවේශයකි.

**ප්‍රමුඛ පද -** චමත්කාරය, රස සංකල්පය, නිරාවරණය, ප්‍රවේශය